# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2368/18 - 2024 ජනවාරි මස 23 වැනි අඟහරුවාදා - 2024.01.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**04 වන සංශෝධනය**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සේවා ව්‍යවස්ථාව

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2015 ජූලි මස 28 වැනි දිනැති අංක 1925/37 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2024 ජනවාරි මස 19 වැනි දින.

I කොටස

සංශෝධන අංක 01 - 2019 සැප්තැම්බර් මස 19 වැනි දින හා අංක 2141/73 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 02 - 2019 දෙසැම්බර් මස 09 වැනි දින හා අංක 2153/6 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 01 - 2020 මාර්තු මස 03 වැනි දින හා අංක 2165/13 *අති විශෙෂ ගැසට් පත්‍රය*

1A - G 41311 — 07 (2024/01)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

II කොටස

## උපලේඛනය - V

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 11.2.2 හි සඳහන් තනතුරු වලට පත්කරීමේ ලකුණු දීමේ පටිපාටිය.

| *ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|
| 1. සේවා පළපුරුද්ද<br>ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සෑම වසරක් සඳහා ලකුණු 5 බැගින් | 50 | 35 |
| 2. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 12 | |
| 3. සන්ධාන භාෂා ප්‍රවීණතාවය | 06 | |
| 4. තොරතුරු සන්නිවේදන හැකියාව | 02 | |
| 5. විෂයය බාහිර ක්‍රියාකාරකම් හා ජයග්‍රහණය | 10 | |
| 6. පර්යේෂණ හා ප්‍රකාශන | 15 | |
| 7. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| **මුළු ලකුණු** | 100 | |

*සටහන :*

1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

2. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයක් ඇතුළත, එක් එක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටියක් අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

EOG 01 - 0206

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.